# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,881 — 1969 නොවැම්බර් 21 වැනි සිකුරාද — 1969.11.21

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි හැම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1801 | තොටුපල් ඓරන්ද හා වෙනත් ඓරන්ද විකිණීම ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... ... | 1804 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... ... | 1805 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාජිය විකිණීම ... ... ... | 1805 | විවිධ දැන්වීම් ... ... ... | — |


සැලකිය යුතුයි.—මෙවර ප්‍රසිද්ධ කරණු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයන්ගේ සහ උපදේශක වරුන්ගේ නාම ලේඛනයක් පළවේ.

## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් කෙළේවත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා යෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

සතියකට නියමිත ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

**විශේෂ නිවේදනයයි**

මුද්‍රිතව පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් භාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ හැම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කරේ. සඳහන්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. ඩී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියලුම නීතිරීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

(iii) (අ) ඔවුන් ස්වකීය රාජකාරි කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අත්‍යවශ්‍යක නොවන්නාවූ අති විශේෂ අවස්ථාවන්හිදී හැර ඔවුන්ගේ ආධුනික පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය තුළදී රාජ්‍ය භාෂාව වන සිංහලය පිළිබඳ ක්‍රියාත්මක දැනුමක් ලබාගත යුතුය.

(ආ) ආධුනික/පරීක්ෂා සේවා කාලය අවසානයේදී ඔවුන්ගේ පත්වීම් ස්ථිර කිරීම, වෙනත් කරුණු අතර කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ තත්ත්වයට වඩා උසස් නොවන තත්ත්වයක් දක්වා යොමුවන නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණ, නියමිත කාල පරිච්ඡේදයක් තුළදී සමත්වීම උඩ රඳා පවතිනු ඇත. නියමිත කාල පරිච්ඡේදයන් ඇතුළත මේ ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් වීමට අපොහොසත් වුවහොත් ඒවා සමත්වන තෙක්, ලැබිය යුතු වැටුප් වැඩිවීම් නොගෙවා හැරීම එහි ප්‍රතිඵලය වන්නේ ය. ස්වකීය ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවසාන වන විට අවශ්‍ය සිංහල ප්‍රවීණතා තත්ත්වය ලබා නොගන්නා නිලධාරීන්ගේ සේවය නතර කරනු ලැබීමට ඉඩ ඇත්තේ ය.

සංලක්ෂ්‍යය.—රාජ්‍ය සේවයට බැඳීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබන අය, පත්වීම් ස්ථිර කිරීමේ පූර්ව නියමයක් වශයෙන් මේ සිංහල ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත් වීමෙන් නිදහස් කරනු ලබති.

5. අවශ්‍ය සුදුසුකම්.—(i) තමා ලාංකිකයෙකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවෙකු විසින්ම ඉදිරිපත් කළ යුතුය. ලාංකික යනුවෙන් සඳහන් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම අඩුම අධ්‍යාපනික සුදුසුකම ලෙස නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන්නකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලත් සිංහලයකු වේනොත් ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් සිංහල භාෂාව විෂයයෙන් හෝ ඊට සමාන විෂයයකින් හෝ සාමාර්ථය ලබා තිබිය යුතුය. (වර්ෂ 1961 ජනවාරි 1 වෙනිදාට පෙර සිට රාජ්‍ය සේවයේ යෙදී සිටියාවූ ද රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු ලබනු කැමැත්තාවූ ද නිලධාරීන් සම්බන්ධයෙන් මෙම නියමය අදාළ නො වන්නේ ය.)

6. යුද්ධ සේවා අනුග්‍රහය.—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙකම සුදුසුකම් ලැබ සිටින්නාවූ, මහා රාජිණියන් වහන්සේගේ යුද්ධ හමුදාවන්හි යෙදී සිටි සේවාමුක්ත වූද අයට සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහාජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි සිය කැමැත්තෙන් ම සේවයෙන් අස්වූවන් හැර) සෑම කෙනෙකුටමද ඔව්හු 1945 අගෝස්තු මස 15 වෙනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සටන්වැදියකු ලෙස හෝ සාමාන්‍ය සේවය කළෝ නම් වයස පිළිබඳ සුදුසුකම් ලබාගැනීම සඳහා පමණක් ඉතා ඇතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මේ දතුර තමන් සේවයෙහි යෙදී සිටි කාල පරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩදෙනු ලැබේ.

7. වෙනත් අවශ්‍ය කරුණු (i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. එසේවුවද වුවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන විසින් ප්‍රසිද්ධ කරන ලද තනතුරක් පිළිබඳව ඉල්ලුම් කරන සෑම රජයේ සේවයේ නිලධාරියෙකු විසින් ම, තම ඉල්ලුම් පත්‍රය එසේ එව්වේ කවදාදැයි, ඒ සඳහා සපයා ඇති "ආ" සලකුණ දරණ මුද්‍රිත තැපැල් පතේ ලියා, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට කලින් හෝ ලැබෙන ලෙස, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන වෙත කෙළින්ම එවිය යුතුය. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු එම ඉල්ලුම්කරුවන් (තෝරාගනු ලැබුව හොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූලව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම්ව සිටින්ද, නැද්දැයි සඳහන් කොට එවිය යුතුය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක දක්වනු ලබන තැනට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමෙකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනුම් සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපෑමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණේ නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණිනම් රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමනයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. සුදුසුකම් ලැබීම සඳහා වැටුප් සන්ධෙහි විග්‍රහය.—සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යනුවෙන් අදහස් කරනුයේ මූලික ස්ථිර තනතුරේ වැටුප් පමණි. වැඩ බැලීම සඳහා ගෙවන වැටුප් දීමනා ආදිය කිසිවක් ඊට ඇතුළත් නොවේ.

---

අංකය. එල්ඊබී/ඇම්/143.

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

### පිටපත්කරු තනතුර

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ පිටපත්කරු තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය හා සේවයේ නියුක්ත කරවීමේ වගන්ති :—** තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වර්ෂයකට රු. 888—18 × 72—2,184 (අංක. 770 හා 1969.9.15 දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව ඒකාබද්ධ වාර්ෂික වැටුප රු. 2,910—18 × 90—4,530) ක වැටුප් ක්‍රමයක් මේ තනතුරට අයත්වේ. රු. 1,608 (ඒකාබද්ධ වැටුප රු. 3,810) ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත.

3. **අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම් :—**

(අ) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ලාංකිකයන් විය යුතුය. අයදුම්කරුවන් 1969 දෙසැම්බර් මස 15 වැනි දිනට වයසින් අවුරුදු 18 ට නොඅඩුවූත්, 25 ට නොවැඩිවූත් විය යුතුය.

(ආ) අයදුම්කරුවන් චිත්‍රකර්මය සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත් වී තිබිය යුතුයි.

නොහොත්

අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගය (සාමාන්‍ය පෙළ) චිත්‍රකර්මය සහිතව එක වරකින් විෂයයන් හයකින් සමත් වී තිබීම හෝ දෙවරකින් විෂයයන් හයකින් සමත් වී ඇත්නම් එයින් විෂයයන් පහක් එකවරදී සමත් වී තිබිය යුතුයි.

(ඇ) සැලසුම් ඇඳීම හා පිටපත් සටහන් කිරීම යනාදී පලපුරුදු අතිරේක සුදුසුකම් වශයෙන් සලකා බලනු ඇත.

4. **සේවා කොන්දේසි :—**

(අ) තෝරාගන්නාලද අයදුම්කරු පත්කිරීමෙන් මාසයක කාලය සඳහා කොළඹ සර්වේ ජනරාල් කාර්යාලයේ අභ්‍යාස පාඨමාලාවක් හදාරණ ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

(ආ) මෙම පත්වීම තුන් අවුරුදු ආධුනික කාල සීමාවට යටත් වේ.

(ඇ) තෝරාගන්නා ලද අයදුම්කරු දෙපාර්තමේන්තු ප්‍රධානියා තීරණය කරන පරිදි ඇප මුදලක් තැබිය යුතුයි.

(ඇ) තෝරාගන්නා ලද අයදුම්කරු දිවයිනේ කවර ස්ථානයක හෝ සේවය කිරීමට බැඳී සිටිනු ඇත.

5. අයදුම් පත් චරිතය හා හැකියාව ගැන මෑතකදී ගත් සහතික පත්‍ර දෙකක් හා උප්පැන්න සහතික පත්‍රය හා අධ්‍යාපන සහතික පත්‍රවල පිටපතක් සමඟ අයදුම්කරුවන් විසින් එවිය යුතුයි. අයදුම් පත්, පහත සඳහන් ආදර්ශ අයදුම් පත්‍රය අනුව අයදුම්කරුවන් විසින් පිළියෙල කර, තැපැල් කවරයේ වම් කෙළවරේ ඉහළ "පිටපත්කරු තනතුර සඳහා ඉල්ලීම" යන්න සඳහන් කර ලියාපදිංචි කළ තැපෑලෙන් "යාපනය දිස්ත්‍රික්කයේ දිසාපති, යාපනය කච්චේරිය, යාපනය" යන ලිපිනයට 1969 දෙසැම්බර් මස 15 දිනට හෝ ඊට පෙර එවිය යුතුයි. අයදුම් පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

6. තවද, මේ සම්බන්ධව ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ පළමුකොට පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

ජේ. ඇම්. සබාරත්නම්,
අතිරේක දිසාපති,
යාපනය දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1969.11.12 දින,
යාපනය දිසාපති කාර්‍යාලයේ දී ය.

## අයදුම් පත්‍රය—පිටපත්කරු තනතුර

1. සම්පූර්ණ නම, ජාතිය හා ලිපිනය (පැහැදිලි අකුරින්) :———.
2. උපන් දිනය හා 1969.12.15 දිනට වයස (උප්පැන්න සහතික පත්‍රයේ පිටපතක් අමුණා එවිය යුතුයි) :———.
3.* උපන් ස්ථානය :—
   (අ) අයදුම්කරු :———.
   (ආ) අයදුම්කරුගේ පියා :———.
   (ඇ) අයදුම්කරුගේ පිය පක්ෂයේ මුත්තා :———.
   (ඈ) අයදුම්කරුගේ පිය පක්ෂයේ මී මුත්තා :———.
4. අධ්‍යාපනික සුදුසුකම් (සමත්වූ දිනයන් සහිතව) :———.
5. පාඨශාලාවෙන් අස්වූ දින සිට කරනු ලබන රක්ෂා (දිනයන්, වැටුප යනාදී විස්තර සහිතව) :———.
6. අමුණා ඇති චරිත සහතික පත්‍රවල සංඛ්‍යාව :———.
7. චරිත සහතික පත්‍ර නිකුත් කළ පුද්ගලයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා තරාතිරම් :———.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

* **සටහන.**—අයදුම්කරු හා ඔහුගේ පියා උපන් ස්ථානය ලංකාව නම් (අ) හා (ආ) කොටස් පමණක් පිරවිය යුතුයි. අයදුම්කරු හෝ ඔහුගේ පියා හෝ දෙදෙනාම උපන් ස්ථානය ලංකාව නොවේ නම් (අ) (ආ) (ඇ) හා (ඈ) කොටස් සියල්ලම පිරවිය යුතුයි.

11-654—69.11.21 දින අංක 14,881 දරන ගැසට් පත්‍රය

## ලංකාවේ චාර්ටඩ් ගණකාධිකාරීන්ගේ ආයතනයේ පරීක්ෂණවලට රජයේ නිලධාරීන් පුහුණු කිරීමේ පහසුකම් ප්‍රදානය කිරීම

චාර්ටඩ් ගණකාධිකාරීන් ලෙස සුදුසු වීම සඳහා චාර්ටඩ් ගණකාධිකාරීන්ගේ ආයතනයෙහි පුහුණු කරවීමට, තම පත්වීම්වල ස්ථිර කර ඇත්තාවූ ද, මේ නිවේදනයේ 2 වන ඡේදයෙහි දක්වා ඇති සුදුසුකම් ඇත්තාවූ ද, රජයේ සේවකයින්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

පුහුණුවීමේ පාඨමාලාව 1970 ජනවාරි 1 වන දින ආරම්භ වේ.

2. **අවශ්‍ය සුදුසුකම්.**—(අ) වයස : 1970 ජනවාරි 1 වන දිනට අවුරුදු 35 ට වැඩි නොවීම.

(ආ) **අධ්‍යාපනික සුදුසුකම් :** පහත සඳහන් අධ්‍යාපනික සුදුසුකම් වලින් එකක්වත් ලබා තිබිය යුතුය :—

(i) ආයතනයේ මණ්ඩලය මගින් අනුමත විශ්ව විද්‍යාලයක උපාධියක් ;

(ii) ලංකා උසස් පාඨශාලා සහතිකය ;

(iii) ලංකා කාර්මික විද්‍යාලයේ ගණකාධිකරණය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ;

(iv) ලංඩන් විශ්ව විද්‍යාලයේ හෝ ලංකා අධ්‍යයන පොදු සහතික පත් (උසස් පෙළ) පරීක්ෂණයේදී හෝ මූලික ගණිතය විෂයයක් වශයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 4 කින් සාමාර්ථය, හෝ ලංඩන් විශ්ව විද්‍යාලයේ හෝ ලංකා අධ්‍යයන පොදු සහතික පත් (උසස් පෙළ) පරීක්ෂණයේදී හෝ දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 4 කින් සාමාර්ථය හා ලංඩන් විශ්ව විද්‍යාලයේ හෝ ලංකා අධ්‍යයන පොදු සහතික පත් (සාමාන්‍ය පෙළ) පරීක්ෂණයේදී හෝ මූලික ගණිතයෙන් හෝ අංක ගණිතයෙන් සම්මාන සාමාර්ථය.

(ඇ) රජය යටතේ සේවය—

(i) රජයේ ගණකාධිකාරී සේවයේ හෝ ගිණුම් පරීක්ෂක සේවයේ හෝ සාමාජිකයෙකු ;

(ii) 1970 ජනවාරි 1 වන දිනට අඩු වශයෙන් අවුරුදු පහක සේවයක් සහිත ආයතනයේ මණ්ඩලය මගින් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයෙකු ; හෝ

(iii) 1970 ජනවාරි 1 වන දිනට අඩු වශයෙන් අවුරුදු පහක සේවය සහිත ලංකා කාර්මික විද්‍යාලයේ ගණකාධිකරණ ඩිප්ලෝමා සහතිකධාරියෙකු ; හෝ

වශයෙන් විය යුතුය.

ගණකාධිකරණය සහ/හෝ ගිණුම් පරීක්ෂක වැඩ පිළිබඳ පෙර පුහුණුවක් ඇති අයට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

3. **තෝරා ගනු ලබන ආකාරය.**—නියමිත පරිදි පත්කරන ලද තේරීම් මණ්ඩලයකින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකින් තේරීම් කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ වේලාව සහ ස්ථානය ඉල්ලුම්කරුවන්ට දන්වනු ඇත.

4. **තෝරා ගනු ලබන ශිෂ්‍යයින් සංඛ්‍යාව.**—පහසුකම් තිබෙන ආකාරයට, අපේක්ෂකයින් 5 දෙනෙකුට නොවැඩි ගණනක් තෝරා ගනු ලැබේ.

5. **පුහුණුවීම්.**—ලංකාවේ චාර්ටඩ් ගණකාධිකාරී ආයතනය මගින් පුහුණුවීමට විධිවිධාන යොදනු ලැබේ.

**පුහුණුවීමේ කාලය මෙසේ ය—**

(i) ආයතනයේ මණ්ඩලය මගින් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයෙකු වෙනුවෙන් අවුරුදු 3 යි.

(ii) වෙනත් අවස්ථාවන්හිදී අවුරුදු 4 යි.

6. **ශිෂ්‍යත්වයේ කොන්දේසි—**

(අ) ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන ශිෂ්‍යයෙකු විසින් පුහුණු වීමේ පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසු අවුරුදු දහයක (10) කාලයක් රජයේ ගණකාධිකාරී සේවයේ හෝ අවශ්‍ය වුවහොත් ගණන් පරීක්ෂක සේවයේ හෝ සේවය කරන බවට පොරොන්දු පත්‍රයකට ඇතුළත් විය යුතුය.

(ආ) ආයතනයට ගෙවිය යුතු ඉගැන්වීමේ ගාස්තු, විභාග ගාස්තු, අධ්‍යාපනික හා තැපැල් මාර්ගික පාඨමාලාමය වියදම් රජය විසින් ගෙවනු ඇත. පුහුණුව හා අදාළ අනෙකුත් අනියම් වියදම් අපේක්ෂකයා විසින්ම දැරිය යුතුවේ. තෝරා ගනු ලබන අපේක්ෂකයනට අවුරුදු දෙකක සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු ද, පුහුණුවීමේ ඉතිරි කාලසීමාව සඳහා අඩ වැටුප් සහිත නිවාඩු ද දෙනු ලැබේ.

(ඇ) ශිෂ්‍යත්වය පහත සඳහන් කොන්දේසි එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ යටතේ නැවැත්වීමට පුළුවන :—

(i) ආයතනය මගින් පවත්වනු ලබන හැඳින්වීමේ දේශන පාඨමාලාව හා අධ්‍යයන පාඨමාලාවන් චාර්ටඩ් ගණකාධිකාරී ආයතනයේ මණ්ඩලය සෑහීමකට පත් වන සේ සම්පූර්ණ කිරීමට අයදුම්කරුවකු අපොහොසත් වුවහොත්—පාඨමාලාවට ඇතුළත් වීමට ඉඩ නොදෙනු ඇත.

(ii) ලංකාවේ චාර්ටඩ් ගණකාධිකාරී ආයතනයේ රෙගුලාසි යටතේ පුහුණුවීම අවසන් වීමෙන්,

(iii) ලංකාවේ චාර්ටඩ් ගණකාධිකාරී ආයතනයේ රෙගුලාසි යටතේ මධ්‍යම විභාගයට පෙනී සිටීමට සුදුසුවී අවුරුද්දක් ඇතුළත එම විභාගය සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමට අපේක්ෂකයා අපොහොසත් වී නම්,

(iv) චාර්ටඩ් ගණකාධිකාරී ආයතනයේ 1960 රෙගුලාසි (නො. 2) හි 28 වන රෙගුලාසියේ විධිවිධාන යටතේ ආයතනය විසින් පුහුණුවීම නවත්වන ලද නම්,

(v) ආයතනයේ 15 (2) රෙගුලාසිය අනුව අපේක්ෂකයා නුසුදුසු යයි සලකනු ලැබුවහොත්,

(ඈ) අපේක්ෂකයකු හට ඉහත 6 (ඇ) ඡේදයෙහි (i) වන වගන්තිය යටතේ පාඨමාලාවට ඇතුළුවීමට ඉඩ නොදුන හොත් හෝ ඉහත (iii), (iv) හෝ (v) යටතේ අපේක්ෂක යෙකුගේ පුහුණුවීම අවසන් කරනු ලැබුවහොත් හෝ ඔහුගේ ශිෂ්‍යත්වය අවලංගු කරනු ලබන අතර එසේ අවලංගු කරනු ලබන දිනය දක්වා ඔහුගේ පුහුණුවීම වෙනුවෙන් රජය මගින් දරන ලද සියළුම වියදම් හා පුහුණුවීමේ කාල සීමාව තුළදී ඔහුට ගෙවන ලද වැටුප් හා දීමනාදියද ඔහු විසින් රජයට ආපසු ගෙවිය යුතු වේ.

7. පහත දක්වෙන ආකෘති පත්‍රය ආකාරයට විය යුතු සියලු ඉල්ලුම් පත්‍ර **1969 නොවැම්බර් 25 වැනි දින හෝ ඊට ප්‍රථම භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්, "ජී" ශාඛාව,** මහා භාණ්ඩාගාරය, කොළඹ යන ලිපිනයට එවිය යුතුය.

8. සියළුම ඉල්ලුම් පත්‍ර ඉල්ලුම්කරු සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් එවිය යුතුය. කෙසේ වුවත්, ඉල්ලුම් පත්‍රයේ පිටපතක් කෙලින්ම භාණ්ඩාගාරය වෙත එවිය යුතුයි.

9. සියළුම ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු ලබන අතර ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින සිට දින තුනක් ඇතුළත ඉල්ලුම් පත්‍ර ලැබුණු බවට දන්වීමක් නොලැබුණහොත් **වහාම** ඒ බව භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම් වෙත දැනුම් දිය යුතුය.

ප. ධ. උඩුවෙල,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1969 නොවැම්බර් මස 11 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.
958/1/166—ජී (XIII)

**7 වන ඡේදයෙහි සඳහන් ඉල්ලුම්පත් ආකෘති පත්‍රය**

### ලංකාවේ චාර්ටඩ් ගණකාධිකාරීන්ගේ ආයතනයේ පරීක්ෂණවලට රජයේ නිලධාරීන් පුහුණු කිරීමේ පහසුකම් ප්‍රදානය කිරීම

1. සම්පූර්ණ නම :————.
   (අ) වාසගම :————.
   (ආ) අනෙකුත් නම් :————.
2. තැපැල් ලිපිනය :————.
3. උපන් දිනය :————.
4. අධ්‍යාපනික සුදුසුකම් :————.
5. දරන තනතුරේ විස්තර :—
   (අ) දෙපාර්තමේන්තුව :————.
   (ආ) දැනට දරන තානතුර :————.
   (ඇ) ස්ථිර සේවයට පළමුවෙන් පත්වූ දිනය :————.
   (ඈ) දරන ලද වෙනත් තනතුරු :————.
   (ඉ) දැනට දරන පත්වීමෙහි ස්ථිර කර ඇත්ද :————.
   (ඊ) ස්ථිර සේවා කාලය :————.
6. විශේෂ හිමිකම් පිළිබඳ විස්තර :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

**දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ නිර්දේශ :** (ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී දෙපාතීමේන්තු ප්‍රධානියා විසින් 3 සහ 5 වන කොටස්වල විස්තර නිවැරදි බව සහතික කළ යුතු අතර, ඉල්ලුම්කරුවන්ගේ වැඩ සහ හැසිරීම සතුටුදායකද යන බව සඳහන් කළ යුතුය.)

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා
පදවි නාමය.

දිනය :————.

11–626—69.11.21 දින අංක 14,881 දරන ගැසට් පත්‍රය

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

### රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 218 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : 500 වැනි තැපැල් පෙට්ටිය, කොළඹ 1,) මුද්‍රණ කඩදාසි සැපයීම සඳහා 1970 පෙබරවාරි 24 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහතකී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ සිත්තම්පලම් ගාඩිනර් මාවතේ රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ සැපයීම් අධ්‍යක්ෂ තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ රුපියල් 100 ක ටෙන්ඩර තැන්පත් මුදලක් බැඳ, ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1970 පෙබරවාරි 23 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ඇස්. ඒ. පී. රූපසිංහ,
සැපයීම් අධ්‍යක්ෂ.

1969 නොවැම්බර් 21 වැනි දින,
කොළඹදී ය.

11–628—69.11.21 දින අංක 14,881 දරන ගැසට් පත්‍රය

### "මයිලව්" නමැති මෝටර් බෝට්ටුව විකිණීම

ඉහත සඳහන් කරුණ පිළිබඳව වූ අංක 14,876 හා 1969.10.17 වැනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ පළවූ දැන්වීම සම්බන්ධයෙන් ටෙන්ඩර්පත් භාර ගන්නා අවසාන දිනය 1969. 12. 27 දින දක්වා දීර්ඝ කරනු ලැබ ඇත. ටෙන්ඩර්පත් 1969.12.27 වැනි දින පස්වරු 3 ට විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් ෆෝර්ම 1969. 12. 20 වැනි දින ප. ව. 2 දක්වා ලබාගත හැක.

ඒ. ඊ. පණ්ඩිතරත්න,
නැව් සුන්බුන් භාරගැනීමේ නිලධාරි.

වෙළඳ නැව් දෙපාර්තමේන්තුව,
එලිසබෙත් ජැටිය, කොළඹ 1.
1969 නොවැම්බර් 21 දින.

11–627—69.11.21 දින අංක 14,881 දරන ගැසට් පත්‍රය

# තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම

## 69.2.26 දින අවසන්කළ කඩදාසි හා කඩදාසි බෝඩ් වර්ග සැපයීම සඳහාවූ ටෙන්ඩරයේ ප්‍රතිඵල

| විෂය අංක | විස්තර | ටෙන්ඩර් කරුවන්ගේ ප්‍රමාණය | සාර්ථක ටෙන්ඩර්කරු | ඇණවුම්කළ ප්‍රමාණය | දිග ටොන් එකක වි.භා.වා. මිල රු. ශ. | නිෂ්පාදිත රට |
|---|---|---|---|---|---|---|
| 1. | ඩබල්සයිඩඩ් රියෙල් සුපරිපයින් ලස්වර් වයිට් ආට් | | | | | |
| | (අ) 20″ × 30″/ග්‍රෑම් 105/රා. 45 | 34 | ඇණවුම් නොකෙරින | — | — | — |
| | (ආ) 23″ × 36″/ග්‍රෑම් 136/රා. 80 | 37 | එම | — | — | — |
| | (ඇ) 23″ × 36″/ග්‍රෑම් 102/රා. 60 | 35 | එම | — | — | — |
| 2. | පියර් කාට්රිජ්—වයිට් | | | | | |
| | (අ) 23″ × 36″/ග්‍රෑම් 102/රා. 60 | 27 | එම | — | — | — |
| | කළු | | | | | |
| | (ආ) 29″ × 45″/ග්‍රෑම් 81/රා. 75 | 10 | එම | — | — | — |
| 3. | බ්ලූ අර්මිලේඩ් ලේජර් | | | | | |
| | (අ) 17″ × 27″/ග්‍රෑම් 87/රා. 28 | 38 | එම | — | — | — |
| | (ආ) 17″ × 27″/ග්‍රෑම් 98/රා. 32 | 39 | එම | — | — | — |
| 4. | බෙස්ට් එයාර්මේල් පේපර් | | | | | |
| | (අ) අනියන් ස්කින් වයිට් 18″ × 23″/ග්‍රෑම් 27/රා. 8 | 15 | බටහිර ජර්මනියේ ඩබ්ලිව්. ඒ. ප්‍රිඩ්ස්සි සමාගම | 3 | 4,390 0 | බටහිර ජර්මනිය |
| | (ආ) එයාර්මේල් බෑන්ක් වයිට් 16″ × 23″/ග්‍රෑම් 27/රා. 8 | 6 | ඒකාබද්ධ රාජධානිය, සීමාසහිත ලෙපර්ඩ් සහ ස්මිත් | 2 | 3,427 31 | ස්වීඩනය |
| | (ඇ) එයාර්මේල් බෑන්ක් බ්ලූ 18″ × 23″/ග්‍රෑම් 27/රා. 8 | 6 | එම | 2 | 3,653 0 | ස්වීඩනය |
| 5. | මැනිපෝල්ඩ් බෑන්ක් | | | | | |
| | (අ) 23″ × 36″/ග්‍රෑම් 31/රා. 18 | 37 | නෝර්වේ, ආර්නි වින්ස්ඩල් | 100 | 2,040 0 | බටහිර ජර්මනිය |
| 6. | මැෂින් ග්ලේස්ඩ් පෝස්ටර් පේපර් | | | | | |
| | (අ) 23″ × 36″/ග්‍රෑම් 48/රා. 28 | 20 | ඇණවුම් නොකෙරින | — | — | — |
| | (ආ) 23″ × 36″/ග්‍රෑම් 54/රා. 32 | 22 | ජපානයේ සීමාසහිත නෙව්මන් සමාගම | 100 | 1,558 0 | ජපානය |
| 7. | රියෙල් ආට් බෝඩ් 29″ × 37″/ග්‍රෑම් 197/රා. 30 | 22 | ඒකාබද්ධ රාජධානියේ සීමාසහිත එෆ්. ඊ. එක්ස්පෝට් සමාගම | 10 | 1,936 12 | ඕස්ට්‍රේලියාව |
| 8. | බොක්ස්බෝඩ් අන්කෝටඩ් වික් ග්‍රේ බැක් | | | | | |
| | (අ) 31″ × 43″/ග්‍රෑම් 250 | 16 | ජර්මනියේ නිව්මන් සහ සමාගම | 300 | 1,018 45 | ජපානය |
| | (ආ) 31″ × 43″/ග්‍රෑම් 400 | 22 | එම | 400 | 943 99 | එම |
| | (ඇ) 31″ × 43″/ග්‍රෑම් 450 | 20 | එම | 50 | 943 99 | එම |
| 9. | ස්ට්‍රෝ බෝඩ් | | | | | |
| | (අ) 25½″ × 30½″/ග්‍රෑම් 455 | 14 | ඒකාබද්ධ රාජධානියේ වාල්ස් ඩෙල්ඩර්පිල්ඩ් | 200 | 626 73 | ඕලන්දය |
| | (ආ) 25½″ × 30½″/ග්‍රෑම් 682 | 14 | ඇණවුම් නොකෙරින | — | — | — |
| | (ඇ) 25½″ × 30½″/ග්‍රෑම් 910 | 14 | ඇනවුම් නොකෙරින | — | — | — |
| | (ඈ) 25½″ × 30½″/ග්‍රෑම් 1820 | 14 | ඒකාබද්ධ රාජධානියේ වාල්ස් ඩෙල්ඩර්පිල්ඩ් | 50 | 701 31 | ඕලන්දය |
| | (ඉ) 25½″ × 30½″/ග්‍රෑම් 2730 | 14 | එම | 10 | 701 31 | ඕලන්දය |

සාමාන්‍යාධිකාරී,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

1969 නොවැම්බර් මස 2 වැනි දින,
356, යුනියන් පෙදෙස,
කොළඹ 2.

11-763—69.11.21 දින අංක 14,881 දරන ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම උසාවියේ ඇති පහත සඳහන් භාණ්ඩ 1969. 12. 22 වැනි දින ප. ව. 2 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මෙයින් දන්වමි.

1. උසාවියේ නියෝගයන් අනුව විකිණීමට නියම කර ඇති භාණ්ඩ.

2. පොලීසිය විසින් උසාවියට ඉදිරිපත් කරන ලද, මෙතෙක් හිමිකරුවන් ඉදිරිපත් වී නොමැති භාණ්ඩ, පොලීසිය විසින් මෙම උසාවියට ඉදිරිපත් කරන ලද අයිතිකරුවන් නොමැති පහත විස්තර සඳහන් ඔරලෝසු ද විකිණීමට බලාපොරොත්තු වෙමි.

(අ) "ඔපල් " වගීයට අයත් අත් ඔරලෝසුවක්.
(ආ) " කැස්ට්‍රෝ " වගීයට අයත් අත් ඔරලෝසුවක්.
(ඇ) " වික්ටොක් " වගීයට අයත් අත් ඔරලෝසුවක්.
(ඈ) " සැපයර් " වගීයට අයත් අත් ඔරලෝසුවක්.
(ඉ) ස්ත්‍රීන් විසින් පැළඳිච්චි කරන අත් ඔරලෝසුවක්.
(ඊ " හෙල්බ්‍රෝස් " වගීයට අයත් අත් ඔරලෝසුවක්.
(උ) " රෝමර් " වගීයට අයත් අත් ඔරලෝසුවක්.

මෙම ඔරලෝසුවල අයිතිකරුවන් ඇතොත් ඒවායේ අයිතිය ඔප්පු කළ හැකි සාක්ෂිත් සමග දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර ඉදිරිපත් වී එම භාණ්ඩ ලබාගත යුතු ය.

3. උසාවියේ නියෝගයන් අනුව විනාශ කිරීමට නියමව ඇති, එහෙත් ප්‍රයෝජනයට ගත හැකි භාණ්ඩ.

වෙන්දේසියේ දී මෙම භාණ්ඩ ගැණුම්කරුවන් විසින් එකවර මුදල් ගෙවා භාණ්ඩ එදිනම රැගෙන යා යුතු බවද දන්වමි. ගෙවීම මුදලින් කළ යුතු ය. චෙක්පත් භාරගනු නො ලැබේ.

සී. ඊ. මෙන්දිස්,
මහේස්ත්‍රාත්, දකුණු කොළඹ.

1969 නොවැම්බර් මස 12 වැනි දින,
දකුණු කොළඹ මහේස්ත්‍රාත් උසාවියේ දීය.

11-636—69.11.21 දින අංක 14,881 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පලකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය.

උපලේඛනය

**1969**

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| ජූනි | 69. 6. 6 සිකුරාද | 69. 5.30 සිකුරාද | දවල් 12.00 |
| | 69. 6.13 සිකුරාද | 69. 6. 6 සිකුරාද | දවල් 12.00 |
| | 69. 6.20 සිකුරාද | 69. 6.13 සිකුරාද | දවල් 12.00 |
| | 69. 6.27 සිකුරාද | 69. 6.20 සිකුරාද | ප.ව. 3.30 |
| ජූලි | 69. 7. 4 සිකුරාද | 69. 6.27 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 7.11 සිකුරාද | 69. 7. 4 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 7.18 සිකුරාද | 69. 7.11 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 7.25 සිකුරාද | 69. 7.18 සිකුරාද | ප.ව. 3.30 |
| ගෝස්තු | 69. 8. 1 සිකුරාද | 69. 7.25 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8. 8 සිකුරාද | 69. 8. 1 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8.15 සිකුරාද | 69. 8. 8 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8.22 සිකුරාද | 69. 8.15 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8.29 සිකුරාද | 69. 8.22 සිකුරාද | ප.ව. 3.30 |
| සැප්තැම්බර් | 69. 9. 5 සිකුරාද | 69. 8.29 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 9.12 සිකුරාද | 69. 9. 5 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 9.19 සිකුරාද | 69. 9.12 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 9.26 සිකුරාද | 69. 9.19 සිකුරාද | ප.ව. 3.30 |
| ඔක්තෝබර් | 69.10. 2 බ්‍රහස්පතින්ද | 69. 9.26 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.10. 9 බ්‍රහස්පතින්ද | 69.10. 2 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 69.10.17 සිකුරාද | 69.10. 9 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 69.10.24 සිකුරාද | 69.10.17 සිකුරාද | දවල් 12.00 |
| | 69.10.31 සිකුරාද | 69.10.24 සිකුරාද | දවල් 12.00 |
| නොවැම්බර් | 69.11. 7 සිකුරාද | 69.10.31 සිකුරාද | දවල් 12.00 |
| | 69.11.14 සිකුරාද | 69.11. 6 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 69.11.21 සිකුරාද | 69.11.14 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.11.28 සිකුරාද | 69.11.21 සිකුරාද | ප.ව. 3.30 |
| දෙසැම්බර් | 69.12. 5 සිකුරාද | 69.11.28 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.12.12 සිකුරාද | 69.12. 4 බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 69.12.19 සිකුරාද | 69.12.12 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.12.26 සිකුරාද | 69.12.18 බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1969 ජූනි මස 13 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.